මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :LAE/2025/72 | 2025.04.25

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අය සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම.

තම ඡන්දය දීමට හැකිවනු පිණිස සේවා නියුක්තිකයන්ට නිවාඩු දීමට සේවා යෝජකයින් කටයුතු කළයුතු බවට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 84අ. (1) වගන්තියෙන් විධිවිධාන සලසා ඇති අතර 2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

2. රාජ්‍ය අංශයේ නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12.3 ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අවම පැය 2 කට නොඅඩු කාලයක් ලෙස ද ඡන්දය ප්‍රකාශ කිරීමට යාම පිණිස අවශ්‍යයැයි හැඟෙන අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩුකිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබාදිය යුතු බවද දක්වා ඇත.

3. පෞද්ගලික අංශයේ විශේෂ නිවාඩු ලබාදීමේ ක්‍රමවේදය බොහෝ සේවා යෝජකයින් තම සේවා නියුක්තීන්ට ඡන්දය පාවිච්චි කිරීම සඳහා ලබා නොදෙන බවට පසුගිය ඡන්ද විමසීම් කිහිපයක දීම පැමිණිලි ලැබී තිබූ බැවින් පෞද්ගලික අංශයේ සේවකයින්ට ඡන්ද විමසීමක දී ඡන්දය පාවිච්චි කිරීමට යෑමට හා ඊමට නිවාඩු ලබාදීම සඳහා දුර හා කාලය අතර සම්බන්ධතාවක් සකස්කරන ලෙසට කරන ලද ඉල්ලීම අනුව 2015 ජනාධිපතිවරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ කොමසාරිස්වරු/ එහි නිලධාරීන්, කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා/ කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හා එහි නිලධාරීන් සහ මැතිවරණ කොමසාරිස්වරයා හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ව ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් වගුවට අනුකූලව පෞද්ගලික අංශයේ සේවය කරන්නාවූ සේවක සේවිකාවන්ට සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබාදීමට අදාළ සේවා යෝජකයින් කටයුතු කිරීම සුදුසු බවට තීරණය කර ප්‍රසිද්ධියට පත් කරන ලදි.

| ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය | ලබාදිය යුතු අවම නිවාඩු කාලසීමාව |
|---|---|
| **කි.මී. 40 ක් හෝ ඊට අඩුනම්** | **දින භාගයයි (½)** |
| **කි.මී. 40 ත් - 100 ත් අතර නම්** | **දින එකයි (1)** |
| **කි.මී. 100 ත් - 150 ත් අතර නම්** | **දින 1 ½** |
| **කි.මී. 150 ට වැඩිනම්** | **දින 2** |

**එමෙන්ම ඉහත සටහනින් යෝජනා කර ඇත්තේ ලබා දිය යුතු අවම කාලය බව ද දිවයිනේ සමහර ඡන්දහිමියන්ට ඡන්ද පොළට යෑමට හෝ ඊමට දින තුනක් අවශ්‍ය වන අවස්ථාද සැලකිය යුතු ප්‍රමාණයක් ඇති හෙයින් අවස්ථාවෝචිතව දින තුනක් නිවාඩු දීමට සිදුවන බවද සැලකිල්ලට ගතයුතු බවද එහිදී අවධාරණය කෙරිනි.**

**4. 2025 මැයි මස 06 දින පැවැත්වීමට නියමිත මෙම ඡන්ද විමසීමේ දී ද ඉහත 3 ඡේදයේ සඳහන් වගුව හා ඉන් මතු දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන මෙම ඡන්ද විමසීමේ දී ස්වකීය සේවා නියුක්තිකයන්ට ඡන්දය දීම සඳහා විශේෂ නිවාඩු ලබා දෙන ලෙස සියලුම සේවායෝජකයන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කර සිටියි.**

5. මෙහිදී, සේවා නියුක්තිකයන් විසින් ලිඛිත ඉල්ලීමක් මඟින් නිවාඩු ඉල්ලුම් කළයුතු අතර, සෑම සේවා යෝජකයකු විසින්ම විශේෂ නිවාඩු ඉල්ලුම් කළ තැනැත්තන් හා නිවාඩු ප්‍රදානය කරන කාලසීමාව දැක්වෙන ලේඛනයක් පිළියෙල කර එය සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කළයුතු වේ.

6. ඉහත සඳහන් නිර්දේශවලට අනුකූලතාව දක්වමින් ස්වකීය ආයතනයේ සේවානියුක්තීන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට යෑමට හා ඊමට ප්‍රමාණවත් කාලයක් හා වැටුප් අඩු කිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබාදෙන ලෙස සියලුම සේවායෝජකයන් වෙතින් නැවතත් ඉල්ලා සිටින අතර, **ආයතනයේ කටයුතුවලට බාධා නොවන අයුරින් ඡන්දය දීමට යාම හා ඊම සඳහා ප්‍රමාණවත් අවම නිවාඩු ලබා ගැනීමට සෑම සේවා නියුක්තියෙකුගේම වගකීම බවද කාරුණිකව අවධාරණය කරනු ලැබේ.**

7. ඉහත විධිවිධාන කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු බන්ධනාගාරගත කිරීමකට හෝ/සහ දඩයකට යටත් විය යුතු බව වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්